සාහිත්‍ය සම්භාෂණ, විශ්ව සාහිත්‍යයේ සිංහල පිය සටහන්, නොදුටු සිනමාව, ඔස්ට්‍රේලියාවේ ප්‍රාදේශිය ප්‍රදේශයකට ශ්‍රාවකයින් රැගෙන යන ගුවන් විදුලි චාරිකාව වැනි මාසික විශේෂාංග මගින් මෙරට අපේ සිංහල ප්‍රජාවගේ විවිධ කලා හැකියාවන් හඳුන්වා-දීමත් සිදුවනවා සේම එම විචාරයන්ට සහ විශේෂාංග වලට නවමු සම්පත් දායකයින්ව සම්බන්ධ කරගැනිම තුළින් ඔවුනුත් අපේ ප්‍රජාවට හඳුන්වා දීමට මට හැකිවුණා. එසේම "විනිවිද" මාසික සමාජ කථිකාව වැනි කාලීන සංවාද තුළින් අපේ ප්‍රජාවේ සිටින ඕනෑම අයෙකුට ගුවන් විදුලිය ට තම අදහස් ප්‍රකාශ කිරීමේ අවස්ථාව ලබා දුන්නා. එය ශ්‍රාවකයන්ට අළුත් අත්දැකීමක්.

එසේම මා ආරම්භ කළ "කැන්ගරු දේසේ අපේ සිංහල භාෂා පාසල" විශේෂාංගය අප ප්‍රජාවේ ඉමහත් පැසසුමට බඳුන් වූ විශේෂාංගයක්. සිංහල භාෂාව පිළිබඳව අපේ දෙවන පරම්පරාව තුළ අභිමානයක් ඇති කරලීමටත් සිංහල භාෂා පාසල් තුළින් සමා-ජයට සිදුවන සේවාව ඇගයීමත් මගේ මුඛ්‍ය පරමාර්ථය වුණා. එසේම ශ්‍රී ලංකාවේ සම්පත් දායකයින් සම්බන්ධ කරගෙන මා විසින් අරඹන ලද "සිංහල සිනමා වංශ කථාව "විශේෂාංගයත් ඉතාම සුවිශේෂියි. ලාංකීය නිහඬ සිනමාවේ සිට මේ දක්වා තිරගත වුණු චිත්‍රපට පිළිබඳව එහිදී කථාබහ කරනවා.එයට ශ්‍රී ලංකාවෙන් සංරක්ෂිත මුල් ගීත පවා ගෙන්වා ගන්නවා. එය ඉතාමත් සංකීර්ණ කාර්යය භාරයක්. එසේම සතියකට වරක් විකාශණය වන මෙම සිංහල සිනමා වංශය සංරක්ෂණය කිරිමටත් මා කටයුතු ආරම්භ කලා. ඒ අනුව බලන කල සිංහල සිනමාව විද්‍යුත් ටිකාවක් ලෙසින් රක්ෂණය වන්නේ SBS මාධ්‍ය ආයතනයේයි. එය ලංකාවේ කිසිදු නාලිකාවකින් මෙතෙක් සිදු නොවූ කාර්යය භාරයක්.

මා SBS සිංහල අංශය භාරගත් පසු සිදුකළ තවත් එක් විශේෂත්වයක් වන්නේ ශ්‍රී ලංකාවේ පසුගිය සමයේදි පැවැත්වුනු ජනාධිපතිවරණ සහ මහමැතිවරණ වලදි විශේෂ මැතිවරණ විකාශ ආරම්භ කිරිම. එහිදී මා විසින් ශ්‍රී ලංකාවේ පූර්ව මැතිවරණ සමීක්ෂණ සිදුකළ පුද්ගලයින් සම්බන්ධ කොටගෙන සිදුකළ මත විමසුම සැබෑ ඡන්ද ප්‍රතිඵල සමග සමපාත වුනා. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා පරාජය වන බව ශ්‍රී ලාංකීය මාධ්‍යයන්ටත් කලින් ජනතාවට දැනුම්දුන්නේ SBS සිංහල වැඩසටහනයි. එය අන්තර්ජාලය තුළින් ලොව බොහෝ පිරිස් අසා තිබීමද විශේෂත්වයක්. තවද අප ගුවන් විදුලිය සෑම ප්‍රාන්තයකටම ශ්‍රවණය වන නිසා මෙල්බර්න් සහ සිඩ්නි නගර වලින් එපිට අනෙකුත් ප්‍රාන්ත වෙත රැගෙන යාමටද මා කටයුතු කළා. ඒ අනුව අනෙකුත් ප්‍රාන්ත වලින් චාර්තාකරුවන් බඳවා ගැනීමේ සිදුකළාඒ අනුව ක්වින්ස්ලන්තය, බටහිර ඔස්ට්‍රෙලියාව, දකුණු ඔස්ට්‍රේලියාව සහ කැන්බරා වලින් බඳවා ගත් චාර්තාකරුවන් හරහා ඒ ඒ ප්‍රාන්ත වල වෙසන සිංහල ප්‍රජාවේ කර්තව්‍යයන් පිළිබඳවත් කථාබහ කිරිමට ගුවන්කාලයක් වෙන් කිරිමට මා කටයුතු ආරම්භ කළා.

සන්නස:
SBS සිංහල අංශයට අළුත් සාමාජිකයින් බඳවා ගැනීමේදි ත් ඔබ ඔය වෙනස්කම් කළාද?

දිල්රුක්ෂි:
ඔව්. යල් පැන ගිය වැඩසටහන් ඉදිරිපත් කිරිමේ ශෛලියෙන් බැහැරවුණු, තරුණ ජවය සහිත නවක කටහඬවල් වැඩසටහනට සම්බන්ධ කර ගැනීමේ අපේක්ෂාවෙන් මා පසුවුණා SBS ආයතනයේ විධායක නිෂ් පාදකවරයාට තම භාෂා වැඩසටහනට අවශ්‍ය පුද්ගලයින් තෝරා ගැනීමේ බලතල හිමිවනවා. ඒ අනුව පසුගිය කාලයේ පවැති සම්මුඛ පරීක්ෂණ වලදි තරුණ ජවය කාර්යක්ෂමභාවය සහ ශ්‍රී ලංකාවේ මාධ්‍ය ක්ෂෙත්‍රයේ අත්දැකීම් ලත් අයට සම්මුඛ පරීක්ෂණ වලදි මා ප්‍රමුඛත්වය ලබාදුන්නා. දැනට අප කණ්ඩායමට ඇතුළත්ව සිටින සංජය දිසානායක සහ මදුර සෙනෙවිරත්න යන නිෂ්පාදකවරුන් එලෙස සිදු වූ මාගේ තේරිම් වලට හොඳම උදාහරණ ලෙස දක්-වන්න පුළුවන්. ඒ අනුව යම් අලුත් මාධ්‍ය පිරිසක් ඔස්ට්‍රේලියාවේ ජාතික මාධ්‍ය තලයට හඳුන්වා දීමට ලැබීම පිළිබඳව මා තුළ ඇත්තේ නිහතමානී සතුටක්.
එසේම සමස්ථ ඔස්ට්‍රේලියාවටම ඇසෙන එකම සිංහල ජාතික වශයෙන් වැදගත් වන තොරතුරු සම්ප්‍රේෂණය කරන ජාතික තලයේ නාලිකාවක මට්ටමකට SBS සිංහල ගුවන්විදුලිය රැගෙන ඒමට මා ගත් උත්සාහය යම්තාක් දුරකට හෝ ඉෂ්ඨ වි ඇති බව මගේ විශ්වාසයයි.

සන්නස:
ශ්‍රී ලංකා රජය සහ එල්. ටි. ටි. ඊ සංවිධානය අතර සටන් විරාම ගිවිසුම අත්සන් කිරිමට අත්‍යාසන්න යුගයේ ඔබ උතුරේ පැවැති එක්තරා මාධ්‍ය සාකච්ඡාවක් ආවරණය කිරිමට සම්බන්ධ වනවා. නැවත හැරි සිතා බලන විට ඒ අත්දැකීම ඔබට සංවේදී වන්නේ කෙසේද?

දිල්රුක්ෂි:
මගේ ඒ අත්දැකීම පිළිබඳව මීට පෙර කිසිදු ප්‍රවත් පතකට හෝ මාධ්‍ය ආයතනයකට මා අදහසක් ප්‍රකාශ කර නැහැ. ඒ සඳහා මා යොමු වූ පළමු අවස්ථාව මෙයයි. ඒ දෙදහස් දෙක වසරේ සටන් විරාම ගිවිසුම අත්සන් කිරිමට සියල්ල සූදානම් වෙමින් පැවති යුගය. මා එකළ ලක්හඬ ගුවන් විදුලියේ "සමාජ ප්‍රවර්ධන වැඩසටහන්" ගනනාවක් ඉදිරිපත් කරමින් සිටි අවධියක්. එකළ විදි දරුවන් පිළිබඳව උදරකා එසිසදබ බ්බන් ආයතනයත් සමඟ සම්බන්ධ වි මා එක්තරා වැඩසටහනක් දියත් කළා. පැඟරල් සංවිධානය ඇතුලු රාජ්‍ය නොවන සංවිධාන ගණනාවක් සමඟ ඒකාබද්ධ වි සමාජ ප්‍රවර්ධනය වෙනුවෙන් වැඩසටහන් රාශියක් මවසින් ඉදිරිපත් කළා. ඩල්සි ද සිල්වා විසින් ආරම්භ කළ කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය යන කාන්තා සංවිධානය සමඟ ඒකාබද්ධ වි මා විසින් නිෂ්පාදනය කළ වැඩසටහන් තුළින් පශ්චාත් සුනාමි බෙදාවාචක පිළිබඳව කළ හෙලිදරව් හේතුවෙන් විශාල වශයෙන් මට බාහිර බලපෑම් එල්ල වුනා. ඇතැම්

දේශපාලනික පාර්ශව ජනතාවට එකී පර්චය මාධ්‍ය හරහා සම්ප්‍රේෂණය වීම තර්ජනයක් කොට සලකුවා. මෙවන් පසුබිමක් මත රාජ්‍ය නොවෙන සංවිධාන සමඟ ම විසින් ගොඩනගාගත් වෘත්තිය සම්බන්ධතා හේතුවෙන් එල්. ටි. ටි. ඊ පාලන බල ප්‍රදේශයකට ගොස් එම සංවිධානය විසින් පවත්වන ලද ප්‍රවෘත්ති සාකච්ඡාවක් වාර්තා කරන්නට මට ඉඩකඩ ලැබුණා. ඒ වන විට මා සේවය කරමින් සිටි මාධ්‍ය ආයතනයටවත් නොදන්වා මගේ දෙමව්පියන්ව පමණක් දැනුවත් කොට මා සහභාගී වූ එක්තරා අවස්ථාවක් ලෙස මේ ප්‍රවෘත්ති සාකච්ඡාව හඳුන්වන්න පුළුවන්. ඇතැම් විට ඒ බව කල් ඇතුව දැනුම් දුන්නා නම් මට ඒ අවස්ථාව නොලැබෙන්නටත් වෙනත් පාර්ශවයක් ඒ සඳහා සහභාගී කරවන්නටත් බොහෝ දුරට ඉඩකඩ තිබුණා යැයි මට දැන් හැඟෙනවා. වර්ල්ඩ් විෂන් ආයතනයේ මැදිහත්වීමෙන් විදෙස් චාර්ථා කරුවන් පිරිසකට වේලුපිල්ලේ ප්‍රභාකරන් ඇතුලු පිරිසක් ලබා දෙන ප්‍රවෘත්ති සාකච්ඡාවක් වෙනුවෙන් තමා ඒ අවස්ථාවෙ මට සහභාගි වෙන්න ලැබුණො. ඊට සහභාගී වූ එකම කාන්තා චරිතය වූයේ මා. ඒ වන විට මා පසුවූයේ ඉතාම ලාබාල වයසක වුවත් ඒ අවදානම දරාගෙන ඊට සහභාගී වන්නට මා පසුබට වූයේ නැහැ. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව හරහා ලබා ගත් විශේෂ බලපත්‍රයක් ඇතුවයි අප මේ සඳහා සහභාගි වුණේ. රජයේ හමුදාව සහ එල්. ටි. ටි. ඊ සංවිධානය අපේ ජීවිත ආරක්ෂාව තහවුරු කළා. ප්‍රථම වතාවට මඩු මන්නාරම් පාර හෙවත් ඒ 9 මාර්ගය විවෘත කළේ ඒ අදියරයේදී. ගමන අතරමගදී මා මගේ සේව-ාස්ථානයට දුරකථනයෙන් අමතා මේ පිළිබඳව ඔවුන්ව දැනුවත් කළා. ඒදින රාත්‍රිය අප ගත කළේ මඩුදේවස්ථානයේ. මැසි මදුරුවන්ගෙන් අපට කිසිදු හිරිහැරයක් සිදු වුණේ නැහැ. එපමණට පරිසරයෙ පවිත්‍රතාවය ඉහළ මට්ටමක තිබුණා. ඉතා කුඩා ඉඩකඩක පවා කිසියම් බෝගයක් වගාකර තිබීම විශේෂත්වයක් වුණා.එහි පාසල් පවා නරඹන්නට මට අවස්ථාව ලැබුණා. ගස් යට පන්ති පවත්වාගෙන ගිය අතර දරුවන් අඟ හිඟකම් වලින් පීඩිත බව පැහැදිලිව පෙනුණ තත්ත්වයක්. පුරා දින 3ක් අප එහි ගත කල නිසා අනාථ කඳවුරු දැකගන්නටත් අවස්ථාව ලැබුණා. ඒවා ඉතාම කුඩා පටු කාමර. දරුවන් කිහිපදෙනා සහ වැඩිහිටියන් ඒ කුඩා ඉඩේ ජීවත්වුණා. ඔවුන් පුවත්පතක් යන්න කුමක්ද කියාවත් දැන හිටියේ නැහැ. රජයෙන් මා-සිකව ලැබුණ කුඩා දිමනාවෙන් ජීවිතය ගැට ගහගත් ඔවුන් දරිද්‍රතාවයේ පතුළටම වැටී සිටියා. මගේ පසුම්බියේ තිබූ ටොෆි කිහිපය දිගු කළ විට දරුවන් විශාල පිරිසක් එය බෙදාගන්නට පොරකෑවා. එය අදටත් ඇසට කඳුලක් ගෙන එන්නට තරම් මා කම්පාවට පත් කළ සිදුවීමක්.

මගේ රටේ වෙනම සංස්කෘතිකමය පරිසරයකට මා අවතීර්ණ වූ බව එදා මට දැනුණා එය වචනයෙන් විස්තර කළ නොහැකි වෙනස්ම හැඟීමක්. සුපුරුදු පරිදි ඒ මාධ්‍ය සාකච්ඡාවටත් ප්‍රභාකරන් සහභාගි වුනේ නැහැ. තමිල් වෙල්වම් සමඟ ප්‍රාදේශිය නායකයින් කිහිප පොළක් පමණයි ප්‍රවෘත්ති සාකච්ඡාවට සම්බන්ධ වුණේ. ඔවුන් කැඩුණු ඉංගිරිසියෙන් සහ දමිළ බසින් අදහස් ප්‍රකාශ කළා. උතුරේ ජනජීවිතය හැබැහින් දැකීම නිසා හටගත් කම්පනය පසුකළෙක "උතුරට යමු" ගුවන් විදුලි වැඩසටහන ආරම්භ කිරිමට මා මෙහෙයවූ ප්‍රධානම හේතුව බව ඔබට නොවලහා කිව යුතුයි. මා මේ ගමනේදී හඳුනාගත් ජෝශප් නම්වූ උතුරේ වැසියෙක් මගේ වැඩසටහනට හැඟෙදාම දුරකථනයෙන් මා සම්බන්ධ කරගත්තා. ඔහුට ඉතාම හොඳින් සිංහල භාෂාව හසුරුවන්නට පුළුවන්කම තිබුණා. ඔහු මේ වැඩසටහන වෙනුවෙන්ම කිලෝමීටර අටක් පමණ පයින් ඇවිත් තැපැල් කන්තෝරුව අසල මගේ ඇමතුම ලැබෙන තුරු බලාසිටියා. අද ඔහු ජීවත්ව සිටිනවාද නැද්ද කියාවත් මා දන්නේ නැහැ. පසුකළෙක ප්‍රබල බාහිර බලපෑම් හමුවේ ඒ වැඩසටහන නවත්වා දැම්මිමට මට සිදුවුණා. මා මට හැකි හැම විටම ජනතාවගේ තොරතුරු දැන ගැනීමේ අයිතිය වෙනුවෙන් මාධ්‍ය භාවිතයක යෙදුණ අයෙක්.අද මා මෙතරම් දුරක් ඇවිත් ඉන්නේ ඒ වෘත්තීය තෘප්තිය සමඟයි.

සන්නස:
ඔස්ට්‍රේලියාව පුරා විහිදී තිබෙන සිංහල භාෂා පාසල් වල දරුවන් සහ ගුරුවරුන් සම්බන්ධ කරගනිමින් ඔබ විසින් සිදුකළ වැඩසටහන් පෙළ දෙමව්පියන්ගේ විශාල පැසසුමකට ලක්වුණා.එම වැඩසටහන් මාලාව දියත් කිරිමේ මූලික අරමුණ කුමක්ද?

දිල්රුක්ෂි:
ප්‍රධාන වශයෙන් සංක්‍රමණික ශ්‍රී ලාංකික ප්‍රජාවට තම මව්බස ඊළඟ පරම්පරාවට දායාද කිරිමට රජයට අනුබද්ධ විධිමත් ආයතනයක් තිබෙන බව දැනුම් දීම සහ ඔවුන් ඒ සඳහා යොමු කිරිමට අනුබලයක් ලබාදීම තමා අපේ මූලික අරමුණ වුණේ.ඒ අරමුණ ඉතාම සාර්ථකයි.බොහොමයක් දෙනා සිංහල භාෂා පාසල් පිළිබඳව තොරතුරු දැනගැනීමට අපව සම්බන්ධකරගත්තා. ඊට අමතරව දෙවන තුන්වන පරම්පරාව වෙත ගුවන්විදුලිය සමීප කරවීම සහ එහි අනාගතය ඔවුන් වෙත පවරාදීම වෙනුවෙන් ඔවුන්ව සූදානම් කිරිමත් අපේ තවත් එක් අරමුණක්. පසුගිය වැඩසටහන් වලදී සාධනීය මට්ටමකින් සිංහල භාෂාව හසුරුවන්නට හැකි දරුවන් පිරිසක් මට මුණ ගැහුණා. පසුකලෙක සමාජ ජාලා වෙබ් අඩවි භාවිතය පිළිබඳව මා විසින් ඉදිරිපත් කළ මත විම-සීමේ වැඩසටහනකට ඒ දරුවන් සම්බන්ධ වි ඉතාම විවෘතව තම මතය ප්‍රකාශ කළාඒ තත්ත්වය ආරම්භයක් හැටියට ඉතාම ප්‍රශංසනීයයි.
මෙවන් කාලීන වැදගත්කමක් සහිත ගුණාත්මක වැඩසටහන් නිර්මාණය කරමින් අනාගත දරුවන් වෙනුවෙන් වැදගත් වන මාධ්‍ය මෙහෙවරක මට හැකි තරම් කාලයක් නිරත වීම තමා මගේ එකම අරමුණ.

සන්නස පුවත්පත වෙනුවෙන් භාකවිජා කර සම්පාදනය කළේ
උපේක්ෂා සේනානායක